සියලු ම හිමිකම් ඇවිරිණි
All Rights Reserved

# දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
## தென் மாகாணக் கல்வித் திணைக்களம்
## Department of Education, Southern Province

08 | S | I

**අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය - දෙවන වාර පරීක්ෂණය - 2019 මාර්තු**

கல்விப் பொதுத் தராதரப் பத்திர (உயர் தர)ப் பரீட்சை - இரண்டாம் தவணைப் பரீட்சை - 2019 மார்ச்

**General Certificate of Education (Adv. Level) - Second Term Test - March 2019**

| 12 ශ්‍රේණිය<br>Grade 12 | කෘෂි විද්‍යාව - I<br>Agricultural Science - I | පැය දෙකයි<br>Two hours |
|---|---|---|

**සැලකිය යුතුයි :**

- **සියලු ම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.**
- **උත්තර පත්‍රයේ නියමිත ස්ථානයේ ඔබේ විභාග අංකය ලියන්න.**
- **1 සිට 50 තෙක් එක් එක් ප්‍රශ්නයට (1) (2) (3) (4) (5) පිළිතුරුවලින් ඉතාමත් ගැළපෙන පිළිතුර කතිර (x) ලකුණකින් යොදා දක්වන්න.**

(01) ශ්‍රී ලංකාවේ විශාලතම බහුකාර්ය යෝජනා ක්‍රමය වන මහවැලි යෝජනා ක්‍රමය යටතේ ඉදිකරන ලද අවසාන ව්‍යාපෘතිය වන්නේ,

1. වික්ටෝරියා ජලාශ ව්‍යාපෘතිය යි.
2. රන්දෙණිගල ජලාශ ව්‍යාපෘතිය යි.
3. මොරගහකන්ද කළුගඟ සංවර්ධන ව්‍යාපෘතිය යි.
4. රන්ටැඹේ ජලාශ ව්‍යාපෘතිය යි.
5. කොත්මලේ ජලාශ ව්‍යාපෘතිය යි.

(02) උඩවලව, මහඉලුප්පල්ලම, ගන්නොරුව යන ස්ථාන වල පිහිටි පර්යේෂණ ආයතන මගින් පර්යේෂණ සිදුකරනු ලබන බෝග පිළිවෙලින්,

1. උක්, ගම්මිරිස්, කුරුඳු
2. ක්ෂේත්‍ර බෝග, ධාන්‍ය බෝග, උද්‍යානබෝග
3. ධාන්‍ය බෝග, උක්, කුරුඳු
4. අලබෝග, උද්‍යාන බෝග, ගම්මිරිස්
5. උක්, ක්ෂේත්‍ර බෝග, උද්‍යාන බෝග

(03) ජල චක්‍රය හා සම්බන්ධ සත්‍ය ප්‍රකාශය වන්නේ,

1. ගලායන ජලය පවතින ආකාර වලින් වැඩි ප්‍රතිශතයක් මිරිදිය හා භූගත ජලය වේ.
2. ජල චක්‍රය කෙරෙහි බලපෑම ඉතා අඩුවෙන්ම දක්වන්නේ ධ්‍රැව ආශ්‍රිත ජලයයි.
3. පෘථිවියේ ඇති ජල ප්‍රමාණය නිතරම වෙනස්වන සුළුය.
4. ජලචක්‍රය තුල ජලය ද්‍රව, වායු වශයෙන් පමණක් පවතියි.
5. වාෂ්පීකරණය මගින් පමණක් වායුගෝලයට ජල වාෂ්ප එකතු වීම සිදුවෙයි.

(04) රාත්‍රි කාලයේ උෂ්ණත්වය අඩුවීම නිසා සිදුවිය හැක්කේ,

1. ශාකවල ශ්වසන වේගය වැඩි වීමයි.
2. ශාකවල මල් පිපීම අඩුවීම.
3. ආහාර සංචිත ප්‍රමාණය වැඩිවීම.
4. ආහාර සංචිත ප්‍රමාණය අඩුවීම.
5. ද්‍රව්‍ය පරිවහනය වේගවත් වීම.

(05) ශ්‍රී ලංකාවේ උඩරට තෙත් කලාපය, පහතරට වියළි කලාපය සහ මැදරට අතරමැදි කලාපය යන කෘෂි පාරිසරික කලාප පිළිවෙලින් නිවැරදිව සංකේතවත් කර ඇත්තේ,

1. $WU_{1a}$, $DL_{1a}$, $IU_{1}$
2. $WU_{1a}$, $DL_{1a}$, $IM_{1c}$
3. $WM_{1a}$, $DL_{1a}$, $IM_{3c}$
4. $WU_{2b}$, $DL_{3}$, $IL_{1a}$
5. $WL_{2a}$, $DL_{1c}$, $IM_{2b}$

The National e-learning Portal for The General Education

(06) පාංශු ව්‍යුහය තැනීමෙහිලා බන්ධන කාරක ලෙස ක්‍රියා **නොකරනුයේ,**

1. කාබනික ද්‍රව්‍ය ය. 2. යකඩ ඔක්සයිඩ ය. 3. කාබනේට ය.
4. නයිට්‍රේට ය. 5. මැටි ය.

* ශ්‍රී ලංකාවේ ප්‍රධාන පාංශු කාණ්ඩ කිහිපයක් පහත දැක්වේ.

a රතු දුඹුරු පස
b රතු කහ පොඩ්සොලික් පස
c දියසිළු පස
d රතු කහ ලැටසෝල් පස
e චූර්ණමය නොවන දුඹුරු පස

(07) ඉහත පස් කාණ්ඩ අතුරින් තෙත් කලාපය පුරාම උච්චත්වයෙන් ඉහළ හා පහළ සෑම ප්‍රදේශකම දක්නට ඇති තෙත් කලාපයේ දර්ශීය පස් වර්ගය වනුයේ,

1. a 2. b 3. c 4. d 5. e

(08) ඉහත පස් කාණ්ඩ අතුරින් තෙත්, වියළි හා අතරමැදි කලාප තුන තුළම එහි භූමියේ පහල කොටසේ දක්නට ඇති අතර, බොහෝ විට වී වගාවට පමණක් සීමාවන පාංශු කාණ්ඩය වනුයේ,

1. a 2. b 3. c 4. d 5. e

(09) පාංශු පැතිකඩ පිළිබඳ සත්‍ය ප්‍රකාශය / ප්‍රකාශ වන්නේ,

A පාංශු ජීර්ණය ආරම්භ වන්නේ R කලාපය තුළ දීය.
B භෞතික හා රසායනික ජීර්ණය මගින් මාතෘ පාෂාණය කුඩා කැබැලි වලට පත්වීමෙන් C ස්ථරය සෑදෙයි.
C A කලාපය සංචායක කලාපය ලෙස හඳුන්වන අතර එය තුළ භාෂ්මික අයන රඳවා ගනියි.

1. A 2 A හා B 3. B හා C
4. A හා C 5. A, B හා C

(10) බෝග වගාව සඳහා පාංශු වර්ණයේ වැදගත්කමක් **නොවන්නේ,**

1. පසේ අඩංගු පෝෂක පිළිබඳ අදහසක් ලබා ගැනීමට ය.
2. පසේ ජලවහනය පිළිබඳ අදහසක් ලබා ගැනීමට ය.
3. පසේ වයනය පිළිබඳ අදහසක් ලබා ගැනීමට ය.
4. ජල සම්පාදනය පිළිබඳ අදහසක් ලබා ගැනීමට ය
5. පසේ වාතනය පිළිබඳ අදහසක් ලබා ගැනීමට ය.

(11) පාංශු ක්ෂුද්‍ර ජීවීන් පිළිබඳ ප්‍රකාශ කිහිපයක් පහත දැක්වේ.

A. ඇමෝනීකරණ බැක්ටීරියා මගින් ප්‍රෝටීනමය සංයෝග වියෝජනය කරයි.
B. $NH_3 / NH_4^+ \longrightarrow NO_2^-$
බවට පත් කිරීමට Nitrobacter වැදගත්වේ.
C. දුර්වල ජලවහනය සහිත ස්ථානවල නයිට්‍රීකරණ බැක්ටීරියා මගින් පසේ ඇති නයිට්‍රජන්, අණුක නයිට්‍රජන් බවට පත් කරයි.
D. Mycorhiza මගින් උසස් ශාකවල පෝෂක අවශෝෂණය කාර්යක්ෂමව සිදු කරයි.

ඉහත ප්‍රකාශ අතරින් සත්‍ය වන්නේ,

1. A හා B පමණි. 2. B හා C පමණි. 3. A හා D පමණි.
4. A, B හා C පමණි. 5. B, C හා D පමණි.

(12) සෞඛ්‍යමත් පසක,

1. මුලු පරිමාවෙන් 25% බැගින් පාංශු ජලය හා පාංශු වාතය අඩංගු වෙයි.
2. සච්ඡිද්‍රතාවයට අනුව මහා අවකාශවලට වඩා ක්ෂුද්‍ර අවකාශ වැඩි පරිමාවක් තිබේ.
3. කාබනික ද්‍රව්‍ය හා පාංශු ජීවීන් 5% ට වඩා අඩුය.
4. පාංශු pH අගය 6.5 - 8 ත් අතර විය යුතුය.
5. දෘෂ්‍ය ඝනත්වය $1.6gcm^{-3}$ වඩා වැඩි විය යුතුය.

(13) පස් සාම්පලයක කැටායන හුවමාරු ධාරිතාවය 20cmol / kg වේ. එහි හුවමාරු කළ හැකි $Al^{3+}$ හා $H^{+}$ අයන ප්‍රමාණය 5cmol/kg වේ නම් පස් සාම්පලයේ භෂ්ම සංතෘප්තිය වනුයේ,

1. 25%  2. 75%  3. 20%  4. 50%  5. 100%

(14) බඩ ඉරිඟු සිටුවා ඇති ක්ෂේත්‍රයක පෝෂක ඌනතාවය නිසා පරිනත ශාක පත්‍ර තද කොළ පැහැයක් ගෙන පසුව දම්පැහැ පෙන්නුම් කරන ලදී. මෙම ඌනතා ලක්ෂණයට යෙදිය යුතු පොහොර වර්ගය වන්නේ,

1. ඇමෝනියම් සල්ෆේට් ය  2. සාන්ද්‍ර සුපර් පොස්පේට්ය
3. මියුරියේට් ඔෆ් පොටෑෂ් ය  4. ඩොලමයිට් ය
5. පොටෑසියම් නයිට්‍රේට්ය

(15) පසේ ඇති පෝෂක පසෙන් ඉවත්වන ආකාර වනුයේ,

1. ඇමෝනීකරණය, නයිට්‍රිකරණය, නයිට්‍රජන් තිර කිරීම
2. නයිට්‍රිහරණය, ඇමෝනීකරණය, ක්ෂරණය
3. ක්ෂරණය, නයිට්‍රිහරණය, වාෂ්පීකරණය
4. ක්ෂරණය, වාෂ්පීකරණය, නයිට්‍රිකරණය
5. වාෂ්පීකරණය, ඇමෝනීකරණය, නයිට්‍රිකරණය

* A - *Rhizobium*
B - *Aspergillus*
C - *Nostoc*
D - *Clostridium*
E - *Pseudomonas denitrificans*

(16) ඉහත දක්වා ඇති ක්ෂුද්‍ර ජීවී කාණ්ඩ අතුරෙන් නිදහස් සයනො බැක්ටීරියා ආකාරයක් වන්නේ,

1. A  2. B  3. C
4. D  5. E

e-තක්සලාව TM The National e-learning Portal for The General Education

(17) පොස්පරස් ද්‍රාව්‍යතාව වැඩිකරන ජෛව පොහොර සෑදීමට භාවිත කරන ක්ෂුද්‍ර ජීවී කාණ්ඩය වනුයේ,

1. A  2. B  3. C
4. D  5. E

(18) සහජීවී නොවන නයිට්‍රජන් තිර කිරීමට දායක වන නිර්වායු ක්ෂුද්‍ර ජීවී කාණ්ඩය වනුයේ,

1. A  2. B  3. C
4. D  5. E

(19) පසෙහි නයිට්‍රජන් ප්‍රමාණය අඩු කිරීමට ක්‍රියාකාරී වන ක්ෂුද්‍රජීවී කාණ්ඩය වනුයේ,

1. A  2. B  3. C
4. D  5. E

(20) සංයුක්ත පොහොර සම්බන්ධයෙන් ප්‍රකාශ කිහිපයක් පහත දැක්වේ.

A. මිශ්‍ර පොහොර වර්ගයකි.
B. N, P හා K පෝෂක මිශ්‍ර කර ඒ වටා ආවරණයක් යොදා ඇත.
C. මහා පෝෂක මෙන්ම ක්ෂුද්‍ර පෝෂක ද ඇතුළත් කර සාදා ඇති පොහොර වර්ගයකි.
D. දිගු කාලයක් පසේ රැදෙමින් පෝෂක නිදහස් කරයි.

මින් සත්‍ය ප්‍රකාශය වන්නේ,

1. A, B හා C පමණි  2. A, C හා D පමණි  3. A, B හා D පමණි
4. B, C හා D පමණි  5. A, B, C හා D පමණි

(21) 

පහත රූප සටහනට අනුව, මෙම පසෙහි

1. Mo සීමාකාරී සාධකය වී ඇත.
2. Mg, Ca හා Fe පමණක් තවදුරටත් ලබා දීම මඟින් විභව අස්වැන්නට ළඟා විය හැක.
3. K වැඩිකරගෙන යාමේ දී P හෝ S හෝ Cu හෝ සීමාකාරී සාධකය බවට පත් විය හැක.
4. N, P, K යන මූලද්‍රව්‍ය පමණක් පසට ලබා දීමෙන් අස්වැන්න වැඩිකර ගත හැක.
5. K පමණක් ලබා දීමෙන් අස්වැන්න වැඩිකරගත හැක.

(22) සිසුවෙක් විසින් තෝරා ගන්නා ලද සෘජු පොහොරවල අඩංගු පෝෂ්‍ය පදාර්ථ ප්‍රමාණයන් කිහිපයක් පහත දැක්වේ.

| | | |
|---|---|---|
| A | N | 46% |
| B | $P_2O_5$ | 45% |
| C | $K_2O$ | 60% |

ඉහත ප්‍රතිශත ප්‍රමාණ අනුව ඊට අදාළ වන පොහොර වර්ග පිළිවෙලින්,

1. අමෝනියම් සල්පේට්, ත්‍රිත්ව සුපර් පොස්පේට්, පොටෑසියම් නයිට්‍රේට්
2. යූරියා, ත්‍රිත්ව සුපර් පොස්පේට්, මියුරියේට් ඔෆ් පොටෑෂ්
3. යූරියා, මියුරියේට් ඔෆ් පොටෑෂ්, එප්පාවල ඇපටයිට්
4. ඇමෝනියම් සල්පේට්, එප්පාවල ඇපටයිට්, සල්පේට් ඔෆ් පොටෑෂ්
5. යූරියා, ඩොලමයිට්, මියුරියේට් ඔෆ් පොටෑෂ් සල්පේට් ඔෆ් පොටෑෂ්

(23) ජල සම්පාදන කාලාන්තරය සම්බන්ධ පහත ප්‍රකාශවලින් සත්‍ය වන්නේ,

A. වැලි පසකට, මැටි පසකට වඩා අඩු කාලාන්තරයකින් ජල සම්පාදනය කළ යුතුය.
B. කැටිති ආකාර ව්‍යුහයක් ඇති පසකට, තැටි ආකාර ව්‍යුහයක් ඇති පසකට වඩා වැඩි කාලාන්තරයකින් ජල සම්පාදනය කළ යුතුය.
C. පාංශු ගැඹුර වැඩි පසකට අඩු කාලාන්තරයකින් ජලය සැපයීම යෝග්‍ය වේ.

1. A පමණි    2. B පමණි    3. C පමණි
4. B හා C පමණි    5. A, B, C සියල්ලම

(24) ජල සම්පාදන ක්‍රම අතරින් පෘෂ්ඨීය ජල සම්පාදන ක්‍රමයක් නොවන්නේ,

1. ඇළි වැටි ජල සම්පාදනය ක්‍රමය
2. කළගෙඩි ජල සම්පාදන ක්‍රමය
3. බේසම ජල සම්පාදන ක්‍රමය
4. වළලු ජල සම්පාදන ක්‍රමය
5. තීරු ජල සම්පාදන ක්‍රමය

(25) පිළිවෙලින් ප්‍රාථමික බිම් සැකසීම, ද්විතියික බිම් සැකසීම හා අතුරුයත් ගෑම සම්බන්ධ ක්‍රියාවන් වනුයේ,

1. පස් කැට පොඩි කිරීම, පස සමතලා කිරීම, වල් පැළ ඉවත් කිරීමය.
2. පස පෙරලීම, පස සමතලා කිරීම, පසට පොහොර යෙදීමය
3. පස පෙරලීම, පස සමතලා කිරීම, පාත්තියක් නිර්මාණය කිරීමය
4. පස පෙරලීම, කැට පොඩි කිරීම, ගස මුලට පස් එකතු කිරීම
5. පස් කැට පොඩි කිරීම, පාත්තියක් සෑදීම, වල්පැල මර්ධනය

(26) 

පහත උපකරණය යොදා ගන්නා බිම් සැකසීමේ අවස්ථාව හා යොදා ගනු ලබන බලය වනුයේ,

1. ප්‍රාථමික, මිනිස් බලය
2. ද්විතියික, යාන්ත්‍රික බලය
3. පශ්චාත්, යාන්ත්‍රික බලය
4. ද්විතියික, මිනිස් බලය
5. පශ්චාත්, මිනිස් බලය

(27) ජල පොම්ප පිළිබඳ සත්‍ය ප්‍රකාශය වනුයේ,

A. කේන්ද්‍රාපසාරී පොම්පවලට වඩා විස්ථාපන පොම්පවල (පිස්ටන් ආකාර) නඩත්තු වියදම් වැඩිය.

B. කේන්ද්‍රාපසාරී පොම්ප මෙන්ම විස්ථාපන (පිස්ටන් ආකාර) පොම්ප ක්‍රියාකිරීමේ දී බොහෝ විට ඉන්ධන භාවිතා කළ යුතුය.

C. මෙම පොම්ප ආකාර දෙකෙන්ම ලබාගත හැකි ජල පහර අඛණ්ඩ වෙයි.

1. A පමණි  2. B පමණි  3. C පමණි
4. B හා C පමණි  5. A, B, C සියල්ලම සත්‍ය වේ.

(28) ජල සම්පාදන කාලාන්තරය තීරණය කිරීමට උපකාරී නොවන්නේ,

1. භාරමිතික ක්‍රමය
2. ක්ෂේත්‍ර ආතති මානය
3. බෝගය දර්ශකයක් ලෙස යොදා ගැනීම
4. පාංශු වයන ත්‍රිකෝණය
5. පිප්සම් කුට්ටි ක්‍රමය

TM The National e-learning Portal for The General Education

(29) බිම් සකස් කිරීමෙන් පසු පසෙහි සිදුවන භෞතික හෝ ජෛවීය වෙනස්කමක් නොවන්නේ,

1. අහඹු රළු බව වැඩිවීමය.
2. කැටයන හුවමාරු ධාරිතා අගය වැඩිවීමය.
3. දෘෂ්‍ය සනත්වය අඩු වීමය.
4. පාංශු සච්ඡිද්‍රතාවය වැඩි වීමය.
5. පාංශු ජීවී ගහනය වැඩි වීමය.

(30) තවානක් සම්බන්ධයෙන් ප්‍රකාශ කිහිපයක් පහත දක්වා ඇත.

A. සිටුවීම සඳහා සුදුසු නිරෝගී හා දිරිමත් පැළ ලබා ගැනීමට හැකිවේ.

B. ඒකාකාරී පැළ ගහනයක් ලබා ගත හැකිය.

C. ක්ෂේත්‍රයේ කෙලින්ම සිටුවීමට වඩා වැඩි බීජ ප්‍රමාණයක් අවශ්‍ය වේ.

මින් සත්‍ය වන්නේ,

1. A පමණි  2. B පමණි  3. C පමණි
4. A හා B පමණි  5. B හා C පමණි

(31) ගොයම් පැළ සිටුවන යන්ත්‍ර මගින් පැළ සිටුවීමේ දී ඒ සඳහා පැළ ලබා ගැනීමට යොදා ගන්නා තවාන් වර්ගය වන්නේ,

1. මඩ තවාන  2. තැටි තවාන
3. ඩැපොග් තවාන  4. ස්පොන්ජ් තවාන
5. උස් තවාන

(32) පෘෂ්ඨීය ජල සම්පාදන පද්ධතියක් හා සැසඳීමේ දී උප පෘෂ්ඨීය ජල සම්පාදන පද්ධතියක,
1. කල් පැවැත්ම වැඩිය
2. ශ්‍රම සූක්ෂ්ම වේ.
3. ලාභදායී ලෙස ස්ථාපනය කළ හැකිය.
4. කාර්යක්ෂම ලෙස ජලය යෙදීමට භාවිතා කළ හැකිය.
5. පහසුවෙන් නඩත්තුව සිදුකළ හැකිය.

(33) ඇළි වැටි ජල සම්පාදනයට යෝග්‍ය වන්නේ,
1. ලෝම පසක් සහිත වළ ගොඩැලිවලින් යුත් භූමියකටය.
2. මැටි අධික පසක් සහිත සමතලා භූමියකටය.
3. වැලි පසක් සහිත සමතලා භූමියකටය.
4. ලෝම පසක් සහිත සමතලා භූමියකට
5. වැලි පසක් සහිත වළගොඩැලිවලින් යුත් භූමියකටය.

(34) පහත රූපසටහනේ දක්වා ඇත්තේ කෘෂි කාලගුණික මධ්‍යස්ථානයක දත්ත ලබා ගැනීම සඳහා යොදා ගත් සටහන් පතකි. එය හා සම්බන්ධ කාලගුණික උපකරණය හා කාලගුණික පරාමිතිය වන්නේ පිළිවෙළින්,



1. සූර්යදීප්ත මානය, ආලෝක ගුණාත්මය
2. සූර්ය විකිරණ මානය, ආලෝක තීව්‍රතාවය
3. සූර්ය විකරණ මානය, ආලෝක කාල සීමාව
4. සූර්ය දීප්ති මානය, ආලෝක තීව්‍රතාවය
5. සූර්ය දීප්ත මාතය, ආලෝකය ලැබෙන කාල සීමාව

(35) ශාකවල ශ්වසන ක්‍රියාවලිය සිදුවන සෛලීය ඉන්ද්‍රියිකාව වන්නේ,
1. හරිතලව
2. ගොල්ගි දේහ
3. මයිටොකොන්ඩ්‍රියම
4. රයිබසෝම
5. අන්තඃප්ලාස්මීය ජාලිකා

(36) ගැඹුරු සී සෑමේ දී,
1. 15 - 20 cm ගැඹුරට සී සානු ලබයි.
2. බහුවාර්ෂික වල්පැළ පාලනයක් සිදුවෙයි.
3. පාංශු ව්‍යුහය විනාශ වෙයි.
4. පසේ තෙතමන ප්‍රමාණය අඩුවෙයි.
5. පසෙහි තද ස්ථර ඇති වෙයි.

(37) පසක දැකිය හැකි ලක්ෂණ කිහිපයක් පහත දැක්වේ.
A. භූගත ජල මට්ටම ඉහළින් තිබීම
B. උප පස තද වීම
C. නිර්වායු ක්ෂුද්‍ර ජීවින් බහුල වීම
D. පාංශු වාතනය දුර්වල වීම

ඉහත ලක්ෂණ අතරින් ජලවහනය දුර්වල පසක ලක්ෂණ වන්නේ,
1. A, B හා C ය.
2. B, C හා D ය.
3. A, B හා D ය.
4. A, C හා D ය.
5. A, B, C හා D ය.

(38) වර්තමානයේ කෘෂිකාර්මික ක්ෂේත්‍රයේ විශාල ගැටලුවක් බවට පත් වී ඇති ''සේනා දළඹුවා'' ගේ හානිය වැනි පළිබෝධ පාලනයට ශාක නිරෝධායනය ඉතා වැදගත් වේ. ශාක නිරෝධායන ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීමේ අධිකාරී බලය ඇත්තේ කුමන ආයතනයට ද?

1. ගොවිජන සේවා දෙපාර්තමේන්තුවට ය.
2. කෘෂි විද්‍යා පීඨයට ය.
3. ආගමන හා විගමන දෙපාර්තමේන්තුවට ය.
4. කෘෂිකර්ම දෙපාර්තමේන්තුවට ය.
5. අපනයන කෘෂිකර්ම දෙපාර්තමේන්තුවට ය.

(39) වර්ෂාභය පිළිබඳ සත්‍ය ප්‍රකාශය / ප්‍රකාශ වන්නේ,

A. වර්ෂාමානය සංස්ථාපනය කළ යුතු වන්නේ පොළොව මට්ටමේ සිට වර්ෂාමානයේ ඉහළ දාරයට 15 cm වන පරිදිය.

B. ස්වයංක්‍රීය වර්ෂාමානයෙන් වර්ෂාපතන තීව්‍රතාවය නිවැරදිව මැනගත හැක.

C. ස්වයංක්‍රීය වර්ෂාමානයට එකතු වූ වර්ෂාපතනය එහි ඇති විශේෂ සටහන් පතක සටහන් වේ.

D. උපකරණ පිහිටුවීමේ දී වර්ෂාමානය හා වාෂ්පීකරණය තැටිය අතර දුර 2m ක් පමණ වේ.

මින් සත්‍ය වන්නේ,

1. A හා B  2. B හා C  3. A හා C
4. C හා D  5. A හා D

♦ **ශාක පෝෂණයේ දී වැදගත්වන ශාක පෝෂක කිහිපයක් පහත දක්වා ඇත.**

N  Ni  Mg  Co  Fe  Mo  Ca

e-තක්සලාව TM The National e-learning Portal for The General Education

(40) ඉහත පෝෂක අතරින් ශාකයේ අඩංගු වියළි බරෙන් 0.1% කට වඩා වැඩි මූලද්‍රව්‍ය වනුයේ,

1. N, Mg, Mo  2. N, Co, Ca  3. Mg, Fe, Ca
4. N, Mg, Ca  5. Ni, Co, Mo

(41) ඉහත මූලද්‍රව්‍ය අතුරින් ශාකයට අත්‍යවශ්‍ය නොවන මූලද්‍රව්‍යයක් වන්නේ,

1. Ni  2. Co  3. Fe
4. B  5. Ca

(42) රනිල ශාකවල නයිට්‍රජන් තිර කිරීමට දායක වන මූලද්‍රව්‍යය වනුයේ,

1. N  2. Mg  3. Fe
4. MO  5. Ca

(43) බඩඉරිඟු ක්ෂේත්‍රයක ශුද්ධ ජල සම්පාදන අවශ්‍යතාව දිනකට 12cm කි. වාරි ජලසම්පාදනයේ දී සම්පූර්ණයෙන්ම හානි වූ ජල සම්පාදන ප්‍රමාණ 4cm නම්, දෛනික ජල සම්පාදන අවශ්‍යතාවය කොපමණ ද?

1. 8 cm  2. 16 cm  3. 20 cm
4. 24 cm  5. 28 cm

(44) ජල වහන කාණු පද්ධති සැලසුම් කිරීමේ දී යොදාගත හැකි ජලවහන කානු පද්ධති ආකාරයක් වනුයේ,

1. විවෘත කාණු  2. සමාන්තර කානු
3. කුට්ටි කානු  4. රොන්මඩ වලවල් සහිත කානු
5. ඇලි හා වැටි

(45) වැවක ප්‍රධාන කොටස් හා ඉන් ඉටුවන කාර්යයන් හා සම්බන්ධව **නොගැලපෙන** ප්‍රකාශය වන්නේ,

1. සොරොව්ව - අවශ්‍යතාව අනුව ජලය නිකුත් කිරීමය.
2. බිසෝකොටුව - සොරොව්වෙන් ජලය පිටවීමේ දී වැව් බැම්මට ඇතිවන පීඩනය පාලනය
3. පිටවාන - අතිරික්ත ජලය පිට කිරීම
4. රළ පනාව - වැව් බැම්ම සේදීයාමෙන් ආරක්ෂා කිරීම
5. දියකැට පහන - ජල පීඩනය මිනුම් ගත කිරීම

(46) 

බෝග සංස්ථාපනයේ දී පහත දැක්වෙන සංස්ථාපන ක්‍රමයට උචිත බෝගය වන්නේ,

1. තේ ය.
2. පොල් ය.
3. වී ය.
4. බඩ ඉරිඟු ය.
5. මුං ය.

(47) බෝග සංස්ථාපනය පිළිබඳ සත්‍ය ප්‍රකාශය වන්නේ,

1. බීජයේ ප්‍රමාණය හා සිටුවන ගැඹුර අතර සම්බන්ධතාවයක් නොමැත.
2. බීජ වැපිරීමෙන් ඒකාකාර පැළ ගහනයක් ලබා ගත හැක.
3. වසරේ ඕනෑම කාලයක දී සාර්ථකව බෝග සංස්ථාපනය සිදු කළ හැක.
4. බෝග සංස්ථාපනයේ දී රෝපණ ද්‍රව්‍යවලට ප්‍රතිකාර කිරීමෙන් සාර්ථක වගාවක් ලබා ගත හැක.
5. වර්ෂාව හිඟ කාලයේ දී බීජ පැළ සංස්ථාපනය වඩා යෝග්‍යය.

(48) වාරි ක්ෂේත්‍රයේ සුවිශේෂී වාරි නිර්මාණයක් වන ජය ගඟ

1. පහළ මට්ටමක පිහිටි තිසා වැවේ සිට උස මට්ටමක පිහිටි කලා වැව දක්වා ජලය ගෙන යයි.
2. පහළ මට්ටමක පිහිටි කලා වැවේ සිට උස මට්ටමක පිහිටි තිසා වැව දක්වා ජලය ගෙන යයි.
3. මහසෙන් රජතුමා විසින් ඉදිකරන ලදී.
4. මහවැලි ගඟේ ජලය දිඹුලාගලට ගෙන යයි.
5. මල්වතු ඔයේ සිට යෝධ වැවට ජලය ගෙන යයි.

(49) ප්‍රභාසංස්ලේෂණය කාර්යක්ෂම කිරීමට යොදා ගත හැකි උපාය මාර්ගයක් **නොවන්නේ,**

1. ශාක අතර නියමිත පරතරය තබා ගැනීම
2. අනවශ්‍ය අතු ඉවත් කිරීම
3. ජලය අතිරික්තව සැපයීම
4. නිවැරදිව පෝෂක ලබා දීම
5. නිවැරදි කප්පාදු ක්‍රම භාවිතය

(50) උත්ස්වේදන ශීඝ්‍රතාවය මිනුම් කිරීමට යොදා ගන්නා උපකරණයක් වනුයේ,

1. ප්ලෑනි මීටරය
2. ආතතිමානය
3. පානමානය
4. වෘද්ධිමානය
5. දෘඪතාමානය